// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1962/7 - 2016 අප්‍රේල් මස 12 වැනි අඟහරුවාදා - 2016.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/05/2008

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

අංක 1944/21 දරන හා 2015.12.27 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් මීගමුව, තලාදූව පාර, අංක 74/2ඒ හි පදිංචි ඩී. එම්. ජේ. කුමාරසිරි මහතා, වැබඩ, ගෝනහේන, අංක 93/7හි පදිංචි වයි. ඩබ්. පියදස මහතා, අත්තනගල්ල, වෙලගෙදර, අංක 176/1 හි පදිංචි එස්. වනිගනෙත්ති මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A3258 දරන හා 2015.08.15 වැනි දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A3258 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2016.12.26 වැනි දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

පළමුවන උපලේඛනය

"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය : ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

දිනය : 2016 මාර්තු මස 16 වැනි දින.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතට ය.

2015.12.07 දිනැති අංක 1944/29 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දවූ ද ඩී. එම්. ජේ. කුමාරසිරි, වයි. ඩබ්. පියදස, එස්. වනිගනෙත්ති සහ ලංකා විදුලිබල මණ්ඩලය බැඳී සිටින්නාවූ ද 2015.08.15 වැනි දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නීතිඥ පී. එච්. අචිලා රිෂාන්ති,
(වගඋත්තරකරු වෙනුවෙන්).
නීති නිළධාරී,
ලංකා විදුලිබල මණ්ඩලය,
තැ. පෙ. 540, කොළඹ 02.

පිටපත් :

1. ඩී. එම්. ජේ. කුමාරසිරි, අංක 74/2ඒ, තල්දූව පාර, මීගමුව
2. වයි. ඩබ්. පියදස, අංක 93/7, ගෝනහේන, වැබඩ
3. එස්. වනිගනෙත්ති, අංක 176/1, වෙලගෙදර, අත්තනගල්ල.

04-1010